සමුගැනීමේ හජ් වන්දනාවෙහි අල්ලාහ්ගේ දූතයාණන් - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා සමග මා ද හජ් කරනු ලැබීය. මාගේ වයස අවුරුදු හතක් විය.

අස්සාඉබ් ඉබ්නු යසීද් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ
ගණයට අයත් හදීසයකි.“සමුගැනීමේ හජ් වන්දනාවෙහි අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා සමග මා ද හජ් කරනු ලැබීය. මාගේ වයස අවුරුදු හතක් විය.“
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත]

අස් සාඉබ් ඉබ්නු යසීද් -රළියල්ලාහු අන්හු- තුමා කුඩා සහාබිවරයෙකි. නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්-තුමාගේ සමයේ ඔහුගේ පවුලේ අය විසින් ඔහු හජ් කරවනු ලැබීය. සමුගැනීමේ අවසන් හජ් අවස්ථාවට සහභාගී විය. දරුවන් සමග හජ් වන්දනාව සඳහා නබි සල්ලල්ලාහු අලය්හි වසල්ලම් ඔවුනට අනුමැතිය දුන්හ. එය අතිරේක හජ් වන්දනාවක් ලෙස සලකන ලදී. ඔහු වැඩිවියට පත් වූ විට නැවත වාරයක් හජ් ඉටු කිරීම ඔහුට අනිවාර්යය වේ. එය ඉස්ලාමයේ හජ් ක්රමයයි. හජ් හි ඉහ්රාම් ඇදීම, මසා නිමකළ ඇඳුම් වලින් වැළකී සිටීම, තල්බියා පැවසීම වැනි වැඩිහිටියන් ක්රියා කරන අයුරින්ම කුඩා දරුවන්ද ක්රියා කරනු ඇත. එය ඔහු විසින් ඉටු කිරීමට නොහැකි වූ විටෙක ඔහු වෙනුවෙන් ඔහුගේ පියා, ඔහුගේ මව වැනි ඔහුගේ භාරකරු එය ඉටු කරනු ඇත. අත්තව්ලීහ් ලිෂර්හිල් ජාමිඉස් සහීහි.:12/473, උම්දතුල් කාරි: 10/218, නුස්හතුල් මුත්තකීන් 2/898, ෂර්හු රියාලුස් සාලිහීන්: ඉබ්නු උසෙය්මීන්: 5/326-327.

https://sunnah.global/hadeeth/si/show/2750